**2019.05.24 වන දින පෙ.ව. 10.00 ට පමණ සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේ වාර්තාව.**

සහභාගී වූ :

1. ගරු කාරක සභා සභාපති - කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා
2. ගරු කාරක සභික - ඇම්.ඒ. මේරි මාග්‍රට් මැතිතුමිය
3. ගරු කාරක සභික - ඩී. කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා
4. ගරු කාරක සභික - ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා
5. ගරු කාරක සභික - දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය
6. ගරු කාරක සභික - ඇම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය
7. ගරු කාරක සභික - ඥාණ ප්‍රකාසම් ෆ්‍රැන්සිස් මැතිතුමා

සහභාගී නොවූ

1. ගරු කාරක සභික - එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා
2. ගරු කාරක සභික - ඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා
3. ගරු කාරක සභික - ඩී.ඩී.අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා
4. ගරු කාරක සභික - එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා

සහභාගී වූ නිලධාරීන් :

1. ලේකම් - කේ.ඒ චන්දන පද්මසිරි මයා
2. ප්‍රධාන කළමනාකරණ සහකාර - කේ.ඩී. සන්ධ්‍යා මාලනී මිය
3. කාර්යභාර නිලධාරී - හංවැල්ල - සුමනා ජයසූරිය මිය
4. කාර්යභාර නිලධාරී - කහහේන - ජී. චමරි පත්මලතා මිය
5. කාර්යභාර නිලධාරී - කොස්ගම - රේණුකා ඉද්දමල්ගොඩ මිය
6. පුස්තකාලයාධිපති - හංවැල්ල - එස්.එම්. රංජනී මිය
7. පුස්තකාලයාධිපති - පාදුක්ක - එම්.ජී. චන්ද්‍රරත්න මයා
8. ප්‍රධාන සංවර්ධන නිලධාරී - කේ.ජී. ශර්මිලා දූෂානි මිය
9. සංවර්ධන නිලධාරී - ඩී.ජී. ඉෂානි කමලිකා මිය
10. පුස්තකාල සහායක - කහහේන - එම්.ඩී. දුලීකා ලක්මිණී මිය
11. පුස්තකාල සහායක - කොස්ගම - කේ.පී. කුමුදිනී ප්‍රියන්තා මිය
12. සෞඛ්‍ය කම්කරු - එච්.ඒ. වත්සලා විනෝදනී

නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවට පැමිණි සියලු මන්ත්‍රීවරුන් හා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය සාදරයෙන් පිළිගත් ගරු කාරක සභා සභාපතිතුමා කාරක සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

## 01. ලිපි ලේඛණ සලකා බැලීම.

1. ප්‍රජා සංවර්ධන නිළධාරී විසින් "වෘත්තීය පුහුණු පාඨමාලා - 2019" යන හිසින් යුතුව 2019.05.24 දිනැතිව සීතාවක ප්‍රාදේශීය සභාව මගින් සභා ප්‍රතිපාදන යොදා ගනිමින් බල ප්‍රදේශයේ ජනතාව සඳහා රැකියා අවස්ථා ඇති කිරීමටත්, අමතර ආදායම් උත්පාදනයටත් අවස්ථාව උදාකර ගැනීමට අවශ්‍ය වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා දැනට ඉල්ලීම් කර ඇති පාඨමාලාවන් පිළිබඳ විස්තර හා ඇස්මේන්තු සමඟ ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, බල ප්‍රදේශයම ආවරණය වන පරිදි කොට්ඨාශ මට්ටමින් ප්‍රජා අවශ්‍යතා මත වෘත්තීය පුහුණු පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

2. ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් "ශිෂ්‍යත්ව විභාගය සඳහා පවත්වනු ලබන අධ්‍යාපනික සම්මන්ත්‍රණය 2019" හිසින් යුතුව 2019.05.13 දිනැතිව අගෝස්තු මස පැවැත්වීමට නියමිතව 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා සීතාවක ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පාසල් දරුදැරියන් 1000 කට පමණ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් ඒ සඳහා සකස් කරන ලද රු.185,000.00 ක ඇස්තමේන්තුව සලකා බැලු කාරක සභාව, මෙම ඇස්තමේන්තුව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත යොමු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

3. හංවැල්ල පිලිප් ගුණවර්ධන අනුස්මරණ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිතුමිය විසින් "ගැබිණි මව්වරුන් සඳහා "සුරකිමු මාතෘත්වය" සම්බන්ධ වැඩසටහන" යන හිසින් යුතුව 2019.05.24 දිනැතිව මාතෘ සායන සංවර්ධන වැඩසටහන යටතේ හංවැල්ල පිලිප් ගුණවර්ධන අනුස්මරණ මහජන පුස්තකාලයේ 2019 ක්‍රියාකාරි සැලැස්මට අනුව පොසොන් පොහොය නිමිති කරගෙන පහත්ගම මාතෘ සායනයේ ගැබිණි මව්වරුන් සඳහා පෝෂ්‍යදායී ආහාර වේලක් පිරිනැමීමට හා මාතෘත්වය සම්බන්ධව කාලීන වූ විශේෂිත දේශනයක් පැවැත්වීම වෙනුවෙන් සකස් කරන ලද රු. 30,750.00 ක ඇස්තමේන්තුව සලකා බැලු කාරක සභාව, මෙම ඇස්තමේන්තුව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත යොමු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

4. ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් "අඩු ආදායම් ලාභින් සඳහා සෙවිලි තහඩු ආධාර ලබා දීම - 2019" යන හිසින් යුතුව 2019.06.14 දිනැතිව 2019 වර්ෂයේ අයවැය ලේඛනයේ වැය ශීර්ෂය 607 (11) යටතේ රු.3000. 000.00 ක මුදලක් වෙන් කර ඇති අතර එක් මන්ත්‍රීවරයෙකු සඳහා හිමි තහඩු ප්‍රමාණය හා ඒ අනුව රු.69,767.00 මුදලක් හිමි වන අතර අඩි.10 ක් දිග ඇස්බැස්ටෝ සීට් සඳහාත් මිල ගණන් ලබා ගැනීමත් අදාල අයදුම් පත්‍රය අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබූ අතර එය මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත යොමු කිරීමට සුදුසු බවට තීරණය කරන ලදී. පෙර වර්ෂයේ මෙසේ ලබාදෙන ලද සෙවිලි තහඩු නිවසක වහලක් සඳහා ලබා දුන්නත් එය වෙනත් අවශ්‍යතාවයන් සඳහා යොදවා ඇති බවට මන්ත්‍රීතුමාලා විසින් ප්‍රකාශ කරන ලදී. මෙම වර්ෂයේ එක් මන්ත්‍රීවරයෙකු සඳහා උපරිම වශයෙන් අයදුම්පත් 03 ක් ලබා දීමටත් එම තහඩු ලබා දීමට පෙර

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව මගින් අදාල අයදුම් කරන ලද නිවෙස් පරීක්ෂා කර බලා නිර්දේශ කිරීමෙන් පසු තහඩු ලබාදීමට තීරණය කරන ලදී.

**5.** ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් **"**අඩු ආදායම් ලාභීන් සඳහා වැසිකිළි ආධාර ලබා දීම **- 2019"** යන හිසින් යුතුව **2019.06.14** දිනැතිව ලිපිය මගින් වැසිකිලි ආධාර වැය ශීර්ෂය **207 (2)** යටතේ රුපියල් ලක්ෂ **15** ක් වෙන් කර ඇති අතර එක් මන්ත්‍රීවරයෙකු සඳහා වෙන්කර ඇති රු**.34,880.00** මුදලක් සඳහා අයදුම්පත්‍ර **3** ක් ලබාදීමටත් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව මගින් පරීක්ෂා කර බලා නිර්දේශ කිරීමෙන් පසු අදාල ආධාර ලබාදීමටත් තීරණය කරණ ලදී.

**6.** හංවැල්ල දිද්දෙණිය උතුර එකමුතු ප්‍රජා මණ්ඩලය විසින් **"**ප්‍රජා මණ්ඩලය ලියාපදිංචි කරගැනීම සඳහායි**"** යන හිසින් යුතුව **2019.05.25** දිනැතිව අංක **439** දිද්දෙනිය **-** උතුර වසමෙහි පිහිටුවාගත් ප්‍රජා මණ්ඩලය ලියාපදිංචි කරදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සඳහා සියලු ලේඛන සපයා ඇති බැවින් ලියාපදිංචියට සුදුසු බවට ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් නිර්දේශ කරන ලද වාර්තාව සලකා බැලූ කාරක සභාව, එකමුතු ප්‍රජා මණ්ඩලය ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට තීරණය කරන ලදී.

**7.** පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප) විසින් **LGD/03/01/04** පොත් මිළදී ගැනීම් හා **2019.05.10** දින මහජන පුස්තකාල සඳහා පොත් ලබා ගැනීම සඳහා හිසින් යුතුව ආචාර්ය රන් බණ්ඩා ජයවර්ධන මහතා විසින් රචිත පහත සඳහන් පොත් පිටපත් **5** බැගින් පුස්තකාල **5** සඳහා මිලදී ගැනීමට කමිටුව තීරණය කරන ලදී.

1. දේශපාලන විද්‍යාව **- 01**
2. දේශපාලන විද්‍යාව **- 02**
3. ජනසන්නිවේදනය හා සන්නිවේදන මූලධර්ම
4. ජනනායක මන්ත්‍රී
5. ශ්‍රී ලංකාද්වීප දේශයේ ගීත
6. ළමා රචනා හුරුව

**8.** සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල සඳහා කතුවරුන් විසින් යොමු කරන ලද පහත සඳහන් පොත් පිටපත් **5** බැගින් පුස්තකාල **5** සඳහා මිලදී ගැනීමට කමිටුව තීරණය කරන ලදී.

| | පොතේ නම | කර්තෘගේ නම | වටිනාකම |
|---|---|---|---|
| **i.** | ජීවිතයට අලුත් හුස්ම | මංගල සෝම ලාල් මහතා | රු**.490.00** |
| **ii.** | මොළෙන් බිස්නස් | මංගල සෝම ලාල් මහතා | රු**.490.00** |
| **iii.** | සිත දිළිදු නැත | මංගල සෝම ලාල් මහතා | රු**.390.00** |
| **iv.** | නර්තනය අතිරේක කියවීම් පොත **I** | ඩබ්.ඒ.රේණුකා සුසාන්තනි මිය | රු**.300.00** |

<u>සාකච්ඡා සටහන්</u>

**1.** සභාව සතු කළුඅග්ගල වින්සෙන් පෙර පාසල ආරම්භ කරන අවස්ථාවේ එහි පෙර පාසල් පාලිකාව විසින් මාවල්ගම පෙර පාසලෙහි ඉගෙනුම ලැබූ දරුවන් කිහිපදෙනෙකු එම පෙර පාසල වෙත රැගෙන ගොස් ඇති අතර එසේ රැගෙන යන ලද එක් දරුවෙකු ගමන් අපහසුතාව මත නැවතත් මාවල්ගම පෙර පාසලට ඇතුළත් කරදෙන ලෙස ගරු මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා වෙත කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව දැනුවත් කරන ලදි. එහිදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද කාරක සභාව ලබන වසරේ පාසලට ඇතුලත් කළයුතු දරුවෙක් බැවින් හා මෙය අනෙකුත් දෙමව්පියන්ට පූර්වාදර්ශයක් නොවන ලෙස සානුකම්පිතව සලකා බලා මෙම දරුවා පමණක් මාවල්ගම පෙර පාසල වෙත නැවතත් ඇතුලත් කර ගැනීමට අවසර ලබාදීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි. එහිදී ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින් පසුගිය දිනවල මාවල්ගම පෙර පාසලෙහි පෙර පාසල් පාලිකාව සම්බන්ධයෙන් ඇතිවූ ගැටළුකාරී තත්වය හා මාවල්ගම පෙර පාසලේ දරුවන් අළුතින් ආරම්භ කරන ලද වින්සෙන් පෙර පාසල වෙත රැගෙන යාම සඳහා එකඟතාවය ලබාදීමෙන් පසු නැවතත් මෙසේ දරුවන්ගේ පෙර පාසල් වෙනස් කිරීම හේතුවෙන් සභාව හැල්ලුවට ලක්වන බැවින් තමන් මේ සම්බන්ධයෙන් විරුද්ධ වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

අද දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේදී ගන්නා ලද ඉහත සඳහන් තීරණ ඇතුලත් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාවට එකඟ වෙමින් පහත අත්සන් තබමි.

1. ගරු කාරක සභා සභාපති - කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා

2. ගරු කාරක සභා සභාපති - එම්.ඒ.මේරි මාග්‍රට් මැතිතුමිය

3. ගරු කාරක සභික - ඩී. කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා

4. ගරු කාරක සභික - ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා

5. ගරු කාරක සභික - දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය

6. ගරු කාරක සභික - එම්.ඩී.මාලනී චන්ද්‍රලතා මැතිතුමිය

7. ගරු කාරක සභික - ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා

කාරක සභාවේ වැඩ කටයුතු ප: ව. 12 . 30 ට පමණ නිමාවට පත්විය.

2019.05.24 වන දින

සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී.